# ඡන්ද රැස්වීම්වලට අදාළ සෞඛ්‍ය නියෝග තුට්ටුවට දාලා

## පැෆරල් කියයි

(විනීතා එම්. ගමගේ)

මැතිවරණ රැස්වීම්වලට අදාළ කොරෝනා රෝග සෞඛ්‍ය රක්ෂිත නියෝගයන් පිළිබඳව දේශපාලන පක්ෂ සහ එම රැස්වීම් සංවිධානය කරන්නන් කිසිදු අවධානයක් යොමු නොකරන බව මැතිවරණ නිරීක්ෂකයන්ගෙන් හා ජනමාධ්‍ය ඔස්සේ ලැබෙන තොරතුරුවලින් පෙනී යන බව පැෆරල් සංවිධානය කියයි.

මේ වන විට සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් 2020 අංක 1 දරන 2019 කොරෝනා රෝගය (කොවිඩ් 19) (ඡන්ද විමසීම් නියෝග) යනුවෙන් එම සෞඛ්‍ය නියෝග ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති නමුත් ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොමැතිවීම අවදානම් සහගත බව ද එම සංවිධානය පෙන්වා දෙයි.

නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 6 වන වගන්තිය අනුව මෙම නියෝග කඩකරන පුද්ගලයන් වැළැක්වීම සහ රඳවාගැනීමට පොලිස් නිලධාරියකුට බලය ඇති බවත් දේශපාලන පක්ෂ ප්‍රසිද්ධියේ මෙන්ම පොලිස් නිලධාරීන් ඉදිරියේ මෙම නියෝග කඩකිරීම් සිදුකරන නමුත් කිසිම පුද්ගලයකුට එරෙහිව පොලිසිය ක්‍රියාකරන බවත් දක්නට නොලැබෙන බවත් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ලංකාදීපයට පැවැසීය.

ඉදිරියේදී සෞඛ්‍යමය වශයෙන් සිදුවිය හැකි අවදානම මෙන්ම නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා මෙම නියෝග කඩකිරීම් සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීමෙන් නියෝග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගන්නැයි වැඩ බලන පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කරමින් ලිපියක් යැවූ බව ද හෙතෙම සඳහන් කළේය.